ඉන්ඩිපෙන්ඩන්ට් ටෙලිවිෂන් නෙට්වර්ක් ලිමිටඩ්හි - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ඉන්ඩිපෙන්ඩන්ට් ටෙලිවිෂන් නෙට්වර්ක් ලිමිටඩ්හි 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍යා ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 61 ඡේදය ප්‍රකාරව පවතින බැඳියාවන් ජංගම නොවන වගකීම් හා ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කළ යුතු වුවත් ඉන් බැහැරව ටොරින්ටන් ඉඩම සඳහා ඉදිරි වසර 8 ක් තුළදී ගෙවිය යුතු හිඟ බදු කුලී වට්නාකම තුළ ඇතුලත් වූ රු. 39,672,000 ක ජංගම නොවන වගකීම් ප්‍රමාණය, ජංගම වගකීම් යටතේම දක්වා තිබුණි.	ඉදිරි වසරේදී වෙන් වශයෙන් ඉදිරිපත් කිරීමට සටහන් කර ගන්නා ලද බව.	ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව ජංගම හා ජංගම නොවන වගකීම් ලෙස වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. .
(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 හි 69 ඡේදය ප්‍රකාරව ජංගම වගකීමක් ලෙස හඳුනාගැනීමේ නිර්ණායකයන්ට පටහැනිව ස්වාධීන රූපවාහිනී සේවයේ රු.87,111,773 ක් වූ ණයගැති බැර ශේෂයන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වගකීමක් ලෙස වෙළඳ ණය හිමි යටතේ දක්වා තිබුණි.මෙම වට්නාකම තුළ රු.29,204,157 ක ණයගැති ලැබීම් නිවැරදි නොවන ණයගැති හා කොන්ත්‍රාත් අංකයන්ට බැරවීම්, ණයගැතියන් වැඩිපුර මුදල් ගෙවීම් හා විනිමය අනුපාතයේ වෙනස්වීම් මත ඇති වී තිබූ අතර ඒවා හඳුනාගෙන ගිණුම්වලින් නිරවුල් නොකිරීම නිසා ණයහිමි වට්නාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි..	විනිමය අනුපාත වැඩි වීම මත වූ වෙනස, එකම ගිණුම් අංකය යටතේ ලැබිය යුතු ශේෂයක් වශයෙන් හා ගෙවිය යුතු ශේෂයක් වශයෙන් ද පෙන්වුම් කරනු ලැබීම, වැරදීමකින් ගිණුම්ගත වීම, මුදල් වැඩිපුර ලැබී තිබීම, ඇත්පවුර වැඩසටහන වෙනුවෙන් එම ආයතනය මුදල් ගෙවීම ආදී වශයෙන් මෙම ශේෂය තුළ පෙන්නුම් කරනු ලබන බවත් මෙම මුදල මේ වසරේ ගිණුම්වලින් ගැලපීමට කටයුතු කරනු ලබන බව හා 2015 ජනාධිපතිවරණය වෙනුවෙන් විකාශනය නොවූ දැන්විම් ඉවත් කල විට ඉතිරිව තිබූ රු.මි.12ක් පසුව ඇති වූ නීතිමය කටයුතු නිසා එම මුදල් නිදහස් කර	නීතිමය කටයුතු හේතුවෙන් අදාල මුදල් හැර ණයගැති බැර ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

	නොමැති බවත් ගෙවිය යුතු ශේෂයක් වශයෙන් පෙන්නුම් කරනු ලබන බව.	
(ඇ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 07 හි 31 සිට 42 දක්වා වන ඡේද ප්‍රකාරව සමාගම විසින් මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති මූල්‍ය උපකරණයන්හි අවදානම් විශ්ලේෂණය කර මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.	මූල්‍ය උපකරණ වශයෙන් ස්ථාවර තැන්පතු පමණක් පවතින බවත්, ඒ සම්බන්ධව ඉදිරියේදී වෙළඳපොළ අවධානම හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශන වල සටහන් මඟින් හෙළිදරව් කිරීමට සටහන් කර ගන්නා ලද බව.	ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය උපකරණයන්හි අවදානම් විශ්ලේෂණය කර මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළ යුතුය.
(ඈ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 හි 5.5.13 සිට 5.5.16 දක්වා වන අපේක්ෂිත ණය අලාභ (Expected Credit Loss) ඡේද ප්‍රකාරව මූල්‍ය වත්කමක ණය අවදානම මූලික හඳුනාගැනීමේ සිට සැලකියයුතු අන්දමින් වැඩි වී ඇත්නම් හානිකරණ අලාභ සඳහා ගැලපීම් කළයුතු වුවත් අයකරගැනීමේ ඉහළ අවදානමක් පවතින ස්වාධීන රූපවාහිනී ආයතනයේ මුළු වාණිජ ණයගැති වටිනාකමින් වර්ෂ 05 ඉක්මවූ වටිනාකම රු.233,444,111 ක් සඳහා එසේ ගැලපීම් සිදුකර නොතිබුණි. එමෙන්ම සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුලදී ප්‍රති වෙළඳ ණය ගැතියන් සඳහා අඩමාණ ණය වෙන් කිරීමේ දී 2013 වර්ෂයට පෙර පැවති මුළු ප්‍රති වෙළඳ ණය ගැති ශේෂ වටිනාකම සඳහා පමණක් වෙන් කර තිබූ අතර 2014 වර්ෂයේ සිට 2021 දක්වා වූ රු.14,182,382 ක ප්‍රතිවෙළඳ ණයගැතියන් සඳහා වූ අඩමාණ ණය වෙන්කිරීම සමාලෝචිත වර්ෂයේ සිදුකර නොතිබුණි.	ප්‍රති වෙළඳ ගනුදෙනු වලට අදාළව මෑත ආසන්න වර්ෂ වල ණයගැතියන් සඳහා හානිකරණ වෙන් කිරීම සිදු නොකළ බවත් අවධානම සැලකිල්ලට ගෙන දීර්ඝකාලීන ණයගැතියන් සඳහා හානිකරණ වෙන් කිරීම පෙර වර්ෂ වල මෙන් සිදු කර ඇති බව.	ප්‍රමිතිය ප්‍රකාරව හානිකරණ අලාභ සඳහා සහ ප්‍රතිවෙළඳ ණයගැතියන් සඳහා අඩමාණ ණය වෙන්කිරීම් සිදුකළ යුතුය.
(ඉ) මූල්‍ය ප්‍රකාශනයන්හි විස්තරාත්මක සටහන් යටතේ දක්වා ඇති මූල්‍ය වත්කම් වර්ගීකරණය 2018 වර්ෂයේ බලාත්මක වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 අනුව සිදු කල යුතු වුවද සමාගම ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 39 අනුව වර්ගීකරණය සිදු කර තිබුණි.	ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 09 අනුව මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් අනාගත මුදල් ප්‍රවාහ තොරතුරු ඉදිරිපත් කල යුතු බැවින් මෙම වර්ෂයේදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කර ඇති බව හා ඉදිරියේදී ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන බව.	මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතය ප්‍රකාරව වර්ගීකරණය කළ යුතුය.
(ඊ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 15 හි 119 හා 124 වැනි ඡේදයන් ප්‍රකාරව ගණුදෙනුකරුවන් සමඟ ඇතිකරගන්නා වූ ගිවිසුම් මත හට ගන්නා අයහාරය සම්බන්ධ කාර්යසාධන බැඳීම් කවරේද යන්නත්, 125 ඡේදය ප්‍රකාරව කාර්යසාධන බැඳීම්	ප්‍රමාණවත් පිළිතුරක් ලබා දී නොමැත.	ප්‍රමිතය ප්‍රකාරව හෙළිදරව් කිරීම් කළ යුතුය.

සම්පූර්ණ කිරීම, ඒ මත අයභාරය හඳුනාගැනීම හා වැදගත් විනිශ්චයන්ට අදාළ හෙළිදරව් කිරීම් සිදු කල යුතු වුවද මූල්‍ය ප්‍රකාශන වල අදාළ හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.		
(උ)) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 21 ප්‍රකාරව, වසන්තම් රූපවාහිනී නාලිකාව සඳහා 2019 වර්ෂයේ සිට විදේශ මුදලින් මිල දී ගන්නා ලද විදේශීය ටෙලිනාට්‍ය 04 ක විකාශය වූ කතාංග සඳහා සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතුව පවතින හිඟ වටිනාකම ඇමෙරිකානු ඩොලර් 354,950 ක් එදිනට පැවති තැන් විනිමය අනුපාතය අනුව පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කර නොතිබුණි. මේ හේතුවෙන් වර්ෂයේ අලාභය රු.12,213,294 ක වටිනාකමින් අවතක්සේරු වී මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උපචිත ගිණුම් ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම උක්ත ප්‍රමිතය ප්‍රකාරව you tube ආදායම ගණනය කිරීමේදී එදිනට පැවති තැන් විනිමය අනුපාතය අනුව පරිවර්තනය කර ගිණුම්ගත කලයුතු වුවත් ඊට පටහැනිව ඩොලර් මිලදීගැනීමේ රේටය අනුව පරිවර්තනය කර ගිණුම්ගත කර තිබුණි.එමෙන්ම මෙහිදී බැංකුව විසින් ඍජුවම අඩුකර තිබූ රු. 360,377 ක මුදල බැංකු ගාස්තු ලෙස ගිණුම් ගත කරනු වෙනුවට විනිමය හුවමාරු අලාභ ලෙස ගිණුම්ගත කර තිබුණි.	ඩොලරයේ සිදු වූ අසාමාන්‍ය වැඩිවීම ආයතනයට දරා ගැනීමට අපහසු බැවින් විදේශීය ටෙලි නාට්‍ය සැපයුම් කරුවන්ගෙන් වට්ටමක් සම්බන්ධයෙන් ඉල්ලීමක් සිදු කල බවත් මේ වන විටත් ගෙවිය යුතු රේටය සම්බන්ධයෙන් අවසාන එකඟතාවයකට පැමිණ නොමැති බව හා දක්වා ඇත. ඉහත රු. 360,377 ක ශේෂය බැංකු ගාස්තු ලෙස යොදා ගෙන ඇති බව.	ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ගෙවිය යුතුව පවතින හිඟ වටිනාකම එදිනට පැවති තැන් විනිමය අනුපාතය අනුව පරිවර්තනය කර මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය.
(ඌ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 අනුව මූල්‍ය ප්‍රකාශන වල සම්බන්ධිත පාර්ශවයන් සම්බන්ධව හෙළිදරව් කිරීම් කල යුතු වුවද සමාගම විසින් ප්‍රධාන කළමනාකාරීත්වයේ පුද්ගලයන් සම්බන්ධයෙන් අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශන වල සටහන් අංක 30 යටතේ හෙළිදරව් කර නොතිබුණි. .	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 අනුව මූල්‍ය ප්‍රකාශන වල සම්බන්ධිත පාර්ශවයන් සම්බන්ධව හෙළිදරව් කිරීම් ඉදිරියේදී සඳහන් කිරීමට සටහන් කර ගන්නා ලද බව.	ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව සම්බන්ධිත පාර්ශවයන් සම්බන්ධව හෙළිදරව් කිරීම් කල යුතුය.
(එ) සමාගමේ මෙහෙයුම් කටයුතු සඳහා තාක්ෂණික උපකරණ බහුලව භාවිතය හා ඒ තුළ සිදුවන නිරන්තර යල්පැනීම් හේතුවෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 හි 09 ඡේදය ප්‍රකාරව සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේම වත්කම් හානිකරණය පිළිබඳ	ඉදිරි වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 36 ප්‍රකාරව වත්කම් හානිකරණ ගැලපීම් කිරීමට කටයුතු කරනු ලබන බව.	ගිණුම්කරණ ප්‍රමිතයට අනුකූලව හානිකරණ තක්සේරුවක් සිදු කර හානිකරණ අලාභ ගිණුම් වලට හඳුනාගත යුතුය.

පරීක්ෂාවක් සිදු කල යුතු වුවත් සමාගම විසින් වත්කම් හානිකරණ තක්සේරුවක් සිදු කර හානිකරණ අලාභ ගිණුම් වලට හඳුනාගෙන නොතිබුණි.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) ටෙලි නාට්‍ය 04 කට අදාළව, සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීමේ වියදම හා ගෙවිය යුතු රු.1,670,000 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීම නිසා සමාගමේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද උපචිත වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන්ද දක්වා තිබුණි.	ටෙලි නාට්‍ය සම්බන්ධව කරන ලද ගෙවීම් නිවැරදි කිරීම සඳහා සටහන් කර ගන්නා ලද බව.	ටෙලි නාට්‍ය මිලදී ගැනීමේ වියදම හා ගෙවිය යුතු වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ) සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහය පිළියෙළ කිරීමේ දී වර්ෂය තුළ මෝටර් රථ, පිරියත හා යන්ත්‍රෝපකරණ, ලී බඩු හා සවිකිරීම් හා වෙනත් ජංගම නොවන වත්කම් විකිණීමෙන් ලද රු. 3,579,874 ක මුදල් ප්‍රවාහයන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ හඳුනාගෙන නොතිබුණු අතර මෙම වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම් බැවින් විකිණීමෙන් ලද මුළු මුදල් ප්‍රවාහයම විකිණීමෙන් ලද ලාභය ලෙස හඳුනාගතහැකි වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ බදු පෙර ශුද්ධ ලාභයට රු.3,579,874 වෙනුවට රු.2,917,303 ක් පමණක් හඳුනාගැනීම නිසා රු.662,571 කින් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි.	නිවැරදි පිළිතුරක් ලබා දී නොමැත.	වත්කම් ඉවත්කිරීමෙන් ලද මුදල් නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දැක්විය යුතුය
(ඇ) සමාලෝචිත වර්ෂයේ පොලී ආදායම රු.37,882,207 ක් ලෙස විස්තීරණ ආදායම් ප්‍රකාශනයට හඳුනාගෙන තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී පොලී ආදායම රු.41,385,242 ක් ලෙස හඳුනාගැනීම නිසා මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.3,503,035 ක් අඩුවෙන් දක්වා තිබුණි.	ආදායම් ප්‍රකාශනයට පොලී ආදායම වශයෙන් දක්වා ඇති රු. 37,882,207 එම වර්ෂයට අදාල වටිනාකම වන අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපීමේදී ඒ සඳහා ආරම්භක ලැබිය යුතු පොලී ආදායම සහ වර්ෂ අවසාන ලැබිය යුතු පොලී ආදායම ගැලපීම් සිදු කර ඇති බව	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී මෙහෙයුම් ලාභය සඳහා ගැලපීම් නිවැරදිව සිදුකළ යුතුය.

(ඇ) මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ මුදල් ප්‍රවාහය ගණනය කිරීම සඳහා කාරක ප්‍රාග්ධන වෙනස්වීම් ගැලපීමේ දී වෙනත් ගෙවිය යුතු දැහි අඩුවීම රු.56,937,978 ක් විය යුතු වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ රු.59,982,315 ක් දක්වා තිබීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ශුද්ධ මුදල් ප්‍රවාහය රු.3,044,337 ක් අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට සටහන් කර ගන්නා ලද බව.	මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී තොරතුරු නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය.
(ඉ) ඉකුත් වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබුණු අලෙවි විධායක කොමිස් රු.3,840,289 ක් වෙන්කිරීමේ ගිණුම හර කිරීම වෙනුවට වියදම් ගිණුම හර කිරීමත්,සමාලෝචිත වර්ෂයද ඇතුළුව අලෙවි විධායක කොමිස් වෙන්කර තිබියදී 2025 වර්ෂයේදී ගෙවූ රු.4,041,085 ක වටිනාකම නැවත වෙන් කිරීමක් ලෙස ගිණුම්ගත කිරීම නිසාත් වර්ෂයේ වියදම් හා ජංගම වගකීම් එම වටිනාකමින් වැඩිපුර දක්වා තිබුණි.එමෙන්ම,2022 වර්ෂයට පූර්ව වර්ෂයන්ට අදාළ අලෙවි විධායක කොමිස් රු.941,262 ක් වෙන් කිරීමේ ගිණුමෙන් ඉවත් කිරීමේ දී රඳවාගත් ඉපයීම් බැර කරනු වෙනුවට වර්ෂයේ වියදම් ගිණුම බැර කර තිබීම නිසා එම වටිනාකමින් වර්ෂයේ වියදම හා රඳවාගත් ඉපයීම් අඩු වී තිබුණි. තවද, අලෙවි විධායක කොමිස් ගණනය කිරීමේ දී 2025 වර්ෂයේ ඉන්වොයිස්පත් භාවිතා කිරීම නිසා රු.177,022 කින් සමාලෝචිත වර්ෂයේ වියදම හා ජංගම වගකීම් වැඩි වී තිබුණි.	2025 වර්ෂයේදී අදාල කාලපරිච්ඡේදය හඳුනාගෙන ඒ අනුව ගිණුම් ගත කිරීමට සටහන් කර ගන්නා ලද බව.	අලෙවි විධායක කොමිස් ගෙවීමේදී, හා වෙන්කිරීමේදී නිවැරදි කාලපරිච්ඡේදය හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඊ) ස්වාධීන රූපවාහිනී ආයතනය සමාලෝචිත වර්ෂයට අදාලව නියෝජිත කොමිස් වියදම වශයෙන් විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුල රු. 8,692,022 ක් හඳුනාගෙන ඇතත් ඒ තුල 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලයට අදාළව සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ නියෝජිත කොමිස් රු.5,601,155 ක් උපචිත වියදම් ගිණුමට හර කරනු වෙනුවට	2025 වර්ෂයේදී අදාල කාලපරිච්ඡේදය හඳුනාගෙන ඒ අනුව ගිණුම් ගත කිරීමට සටහන් කර ගන්නා ලද බව.	අලෙවි විධායක කොමිස් ගෙවීමේදී, අදාළ නිවැරදි කාලපරිච්ඡේදය හා නිවැරදි ගිණුම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

ප්‍රවර්තන වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.ඒ අනුව රු. 5,601,155 කින් ප්‍රවර්තන වර්ෂයේ ලාභය අඩු වී ජංගම වගකීම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.		
(උ) 2011 වර්ෂයේ මිල දී ගෙන තිබුණු රු.1,037,763 ක් වටිනා ඉංග්‍රීසි චිත්‍රපට 12ක් අස්පෘශ්‍ය වත්කම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට ඉදිරියට කරන ලද ගෙවීමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් අස්පෘශ්‍ය වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.	මෙම චිත්‍රපට විකාශන ගිවිසුම් කාලය අවසන් වී ඇති බවත් මේ සම්බන්ධයෙන් විගණන කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලබන බව.	මෙම චිත්‍රපට විකාශන හැකියාව තහවුරු කර සුදුසු පරිදි භාවිතයට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය.
(ඌ) 2023 වර්ෂයේ අත්සන් කරන ලද ප්‍රතිවෙළඳ ගිවිසුමේ 1 හි 1.1 (ඕ) ප්‍රකාරව චැනල් පවත්වාගෙන යාමේ කුලිය හා අධි විභේදන කේතන (HD Encoder) කුලිය වශයෙන් කාර්තුවකට රු.1,500,000 ක් එනම් වසරකට රු.මිලියන 06 ක් ගෙවිය යුතු වුවත් එම කුලී වියදම සමාලෝචිත වර්ෂයේ ගිණුම්ගත කර නොතිබුණි.	2023 වර්ෂයේ SLT ගිවිසුම් ප්‍රකාරව සියලු දැන්වීම් ලබා ගෙන ඇතත් එහි සේවය සමාගම ලබා ගනිමින් පවතින බැවින් ලිපි ලේඛන ගෙන්වා ගෙන මේ වර්ෂයේදී ගිණුම් වලට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලබන බව.	ප්‍රතිවෙළඳ ගිවිසුම් ප්‍රකාරව චැනල් පවත්වාගෙන යාමේ කුලිය හා අධි විභේදන කේතන (HD Encoder) කුලිය ගිණුම්ගත කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂයේ සමාගමෙහි මුළු වාණිජ ණයගැති ශේෂය රු.941,388,050 ක් වූ අතර ඉන් රු.369,161,342 ක් හෙවත් සියයට 39ක් වර්ෂ 01 ක් ඉක්මවූ ණයගැති ශේෂ වලින් සමන්විත වූ අතර ඉන් රු.233,444,111 හෙවත් සියයට 29ක් අවුරුදු 05 ඉක්මවූ ණයගැති ශේෂ වලින් සමන්විත වී තිබුණු අතර එම ශේෂයන් සමාලෝචිත වර්ෂය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.තවද, සමාලෝචිත වර්ෂයේ ප්‍රතිවෙළඳ ණයගැති වටිනාකම රු.35,705,603 ක්	2001 වසරේ සිට 2023 වසර දක්වා වසර 22ක පමණ කාලයක සිට සිදුවූ ගනුදෙනු වලට අදාලව පොත්වල පෙන්නුම් කරන ශේෂයන් බවත් එම ශේෂයන් හඳුනා ගෙන කොටස් වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමු කර පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව හා ණය අය කර ගැනීමේ ක්‍රමවේදය පෙර කාලයට වඩා ශක්තිමත් කර ගෙන ඇති බව.	ණයගැති ශේෂ නොපමාව අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

වන අතර එම ශේෂයෙන් සියයට 73 ක් හෙවත් රු.26,102,280 ක් වසර පහ ඉක්මවූ ණය ගැති ශේෂ වන අතර ඒ තුළ 2023 වර්ෂයේ ගිවිසගත් ප්‍රතිවෙළඳ ගිවිසුම මත රු.6,881,600ක ණයගැති වටිනාකමක් පවතින අතර ඒවා අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ දී කටයුතු කර නොතිබුණි.		
(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වසන්තම් ටී.වී හි වෙළඳ ණයගැති යටතේ වූ වාණිජ ණයගැති වටිනාකම ගණනය කිරීමේදී රු.19,721,115 ක් වූ ණයගැති බැර ශේෂයන් හඳුනාගැනීමකින් තොරව මුළු වාණිජ ණයගැතියන්ගෙන් අඩුකර ගිණුම්වල දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වාණිජ ණයගැති වටිනාකම එම ප්‍රමාණයෙන් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණු අතර එය මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහනක් මඟින් හෙළිදරව් කිරීම් කර හෝ නොතිබුණි.	ණයගැති ගිණුම් වයස් විශ්ලේෂණය (Age Analysis), කාලපරිච්ඡේද අනුව වෙන් කර ඇති බවත් ණයගැතියන්ගේ අවසාන ශේෂය ශුද්ධ අගයක් ලෙස එහි දක්වා ඇති බවත් එක් ණයගැතියෙක් ලෙස හඳුනා ගත්තද, උපලේඛන අංකය අනුව ණයගැතියන් කිහිප දෙනෙක් සිටින බවත් ඒකල ණයගැතියන් වෙන් වෙන් වශයෙන් අධ්‍යයනය කොට තනි අගය ලබාගෙන ඇති බව හා කිසිදු ණයගැති ශේෂයක් අඩුවෙන් දක්වා නොමැති බව.	ණයගැති බැර ශේෂයන් හඳුනාගැනීමට කටයුතු කළ යුතුය.මුළු ණයගැතියන්ගෙන් අඩුකර නොදැක්විය යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ලංකා බැංකුව ටොරින්ටන් හා පැලවත්ත ශාඛාවන්හි ජංගම ගිණුම් වෙත ලැබී තිබූ රු.2,653,561 ක මුදල් ලැබීම්, හඳුනාගැනීමට කටයුතු නොකර ණයහිමි ශේෂ වශයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ජංගම වගකීමක් ලෙස වෙළඳ ණය හිමි ශේෂයන් යටතේ දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වෙළඳ ණය හිමි වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.	2024 වර්ෂයේදී වර්ෂ 03කට වැඩි මෙම ශේෂයන් ගැලපීමට කටයුතු කරනු ලබන බව.	හිමිකම් නොපෑ ශේෂ ගිණුම් වල ගැලපීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 3.1 වගන්තිය	ඉන්ධන පරීක්ෂාව සිදුකිරීමේ දී වාහනය නගරය තුළ සහ පිටත ධාවනය කළ යුතු දුර කිලෝ මීටර් 80 ක් වුවත් සමාගමේ වාහන 33 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමේ දී කිලෝ මීටර් 100 ත් 200 ත් අතර දුර ප්‍රමාණයක් ලිඛිත අනුමැතියකින් තොරව ධාවනය කර තිබුණි.	ඉන්ධන පරීක්ෂාව ආරම්භයේදී සමාගමේ වැඩ සටහන් සඳහා වාහන ධාවනයේදී පරීක්ෂණ කටයුතු කිරීමට කටයුතු කර ඇති බවත් ඉහත තොරතුරු මත වඩාත් සුදුසු නිර්ණායක ලෙස වැඩි කි.මී.ප්‍රමාණයක් ධාවනය කර ඉන්ධන පරීක්ෂාව සිදු කිරිමට තීරණය කර ඇති බව.	ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමේ දී චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.13,114,063 ක අලාභයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අලාභය රු.213,739,466 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි ඉකුත් වර්ෂයේ අලාභය රු.200,625,403 කින් පහළයාමක් නිරීක්ෂණය විය. මෙම අලාභය පහලයාමට ඉකුත් වර්ෂයන්ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුල ගුවන් කාල විකුණුම් රු.318,344,178 ක් එනම් සියයට 23කින් ඉහල යාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

2022 වර්ෂයේ දී රු.1,394,668,739 ක් හා 2023 වර්ෂයේ දී රු.1,385,459,165 ක් වූ ගුවන් කාල විකුණුම් ආදායම සමාලෝචිත වර්ෂයේ රු.1,703,803,343 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 22 ක වැඩිවීමකි. අනෙකුත් ආදායම් 2023 වර්ෂයේ දී රු.215,718,957 ක් ද සමාලෝචිත වර්ෂයේ දී රු.202,635,890 ක් ද වූ අතර ඉකුත් වර්ෂයට සාපේක්ෂව එය සියයට 6 කින් අඩු වී තිබුණි.ශුද්ධ මූල්‍ය ආදායම සමාලෝචිත වර්ෂයේ දී රු.13,091,626 ක් වූ අතර 2023 වර්ෂයේ දී රු.70,597,357 ක් එනම් සියයට 81 ක අඩුවීමකි. එමෙන්ම 2023 වර්ෂයේ දී රු.541,971,692 ක් වූ වැඩසටහන් වියදම් සමාලෝචිත වර්ෂයේ දී රු.574,357,625 ක් වූ අතර එනම් සියයට 6 කින් වැඩසටහන් වියදම් වැඩි වී තිබුණි.සමාලෝචිත වර්ෂය තුල අලෙවි වියදම් රු.62,883,414 ක් වූ අතර ඉකුත් වර්ෂයේ රු.97,563,953 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 36 කින් අඩු වී තිබුණි.2023 වර්ෂයේ වෙනත් මෙහෙයුම් සහ පරිපාලන වියදම් රු.1,268,848,083 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී රු.1,269,234,400 ක් එනම් පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 0.03 ක වැඩිවීමකි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) කොකාවිල් විකාශනාගාරයේ සම්ප්‍රේෂණ කටයුතු සඳහා විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව විසින් සමාගම වෙත යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් 2016 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා එම ආයතනය වෙත විදුලිය සඳහා ගෙවිය යුතු වටිනාකම වූ රු.25,707,934 ක් ගෙවා නොතිබුණි. 2023 අප්‍රේල් මස 06 වන දින සිට කොකාවිල් විකාශනාගාරයේ විකාශණ කටයුතු නවතා තිබීම හේතුවෙන් වසන්තම් ටීවී,ලක්හඩ සහ වසන්තම් එෆ්.එම් නාලිකා කොකාවිල් සම්ප්‍රේෂණ කුළුණ හරහා සිදු කරන ලද සම්ප්‍රේෂණ කටයුතු ද නවතා තිබුණි. තවද, 2015 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කොකාවිල් සම්ප්‍රේෂණ කුළුණ සඳහා සමාගම විසින් ගෙවිය යුතු හිඟ බදු කුලිය රු.48,750,000 ක් විය.	2009 උතුරු වසන්තය වැඩසටහන යටතේ උතුරු නැගෙනහිර ප්‍රදේශ සඳහා විකාශනය පුළුල් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුව වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වූ බවත් 2009 වර්ෂයේ සිට මේ දක්වා කිසිදු විකුණුම් ආදායමක් එම ව්‍යාපෘතිය මඟින් උපයා ගැනීමට නොහැකි වූ බවත් මෙම අකාර්යක්ෂමතාවය මත කළමනාකරණය විසින් සම්ප්‍රේෂණ කටයුතු නවතා දැමීමට සාකච්ඡා පැවැත්වූ බවත් දක්වා ඇත. එමෙන්ම හිඟ බදු කුලිය වූ රු. 48,750,000 ක මුදල විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මඟින් 2009 වර්ෂයේ සිටම ලියා හැරීමට සාකච්ඡා වට කිහිපයක් අවසානයේ එකඟ වී ඇති බව.	අකාර්යක්ෂම ව්‍යාපෘතියක් ලෙස අදාළ තොරතුරු ඉදිරිපත්කර විධිමත් අනුමැතියක් යටතේ කොකාවිල් විකාශනාගාරයේ විකාශණ කටයුතු හා කොකාවිල් සම්ප්‍රේෂණ කුළුණ හරහා සිදු කරන ලද සම්ප්‍රේෂණ කටයුතු සම්බන්ධයෙන් තීරණයක් ගතයුතුය.
(ආ) සමාගම විසින් විකාශනාගාර කුළුණු දුරකථන සමාගම් වෙත බදු දීමේ දී දුරකථන සමාගම් සමඟ එළඹි බදු ගිවිසුම් 06 ක් අවලංගු වීමෙන් පසුව එළඹෙන කාලපරිච්ඡේදයට අදාලව එම ගිවිසුම් අළුත් කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.	නව ගිවිසුම් වලට එළඹීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇති බවත් අදාල අනුමැතීන් ලද පසු නව ගිවිසුම් වලට එළඹීම සිදු කරනු ලබන බව.	විධිමත් ගිවිසුම් වලට එළඹීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ක්‍රියාකාරී සැලැස්මේ අලෙවි අංශය සඳහා ආදායම් උත්පාදනය කිරීම යටතේ ගුවන් කාලය අලෙවි කිරීම තුළින් රු.මිලියන 2008 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණි. එහිදී අයිටීඑන් ටී.වී , වසන්තම් ටීවී,ලක්හඬ හා වසන්තම් එෆ්.එම් සඳහා ප්‍රධාන ක්‍රියාකරකම් 08 ක් තුළින් ආදායම්	2024 වර්ෂය සඳහා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි විවිධ හා අලුත් වැඩසටහන් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වුවත් අපේක්ෂා කළ පරිදි නිෂ්පාදන කටයුතු වලට අනුව වෙළඳ අංශයෙහි අනුග්‍රාහකයින් ලබා	අලාභ අවම කර ගැනීමටත් ආදායම් වර්ධනය කර ගැනීමටත් කටයුතු කළ යුතුය.

උත්පාදනය ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතියට අනුව ප්‍රධාන ක්‍රියාකාරකම් 04 ක් පමණක් භාවිතා කරමින් රු.මිලියන 2071 ක ආදායමක් උපයා තිබූ බවට දක්වා තිබුණද සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ආදායම රු.මිලියන 1756 කි. වසන්තම් ටී.වී සඳහා වැඩසටහන් 15 ක් සැලැස්ම තුළ ඇතුළත් කර තිබුණද නිම කර තිබුණේ වැඩසටහන් 05 ක් පමණි. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් නොවූ වැඩසටහන් 24 ක් සඳහා රු.මිලියන 17 ක් වියදම් කර වර්ෂය තුළ දී අවසන් කර තිබුණි.	ගැනීමට තිබූ දුෂ්කරතාවය හේතුවෙන් එය ඉටු කිරීමට නොහැකි වූ බව.	
(ආ) රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයේ 217 වගන්තියේ (2) (VI) (ආ) උප වගන්තිය ප්‍රකාරව වාණිජ කටයුතු සඳහා කරනු ලබන බදු දීම් වලට අදාලව සෑම පස් අවුරුද්දකට වරක් බදු ප්‍රතිශෝධනය කල හැකි අතර සමාගම විසින් යටියන්තොට බදු ඉඩම සඳහා 2007 වර්ෂයේ සිට වාර්ෂික බදු මුදල් ගෙවීමේ දී මේ දක්වා බදු හිමියා විසින් සිදු කරන ලද බදු ප්‍රතිශෝධනයන් සැලකිල්ලට ගෙන නොතිබුණි.මේ හේතුවෙන් බදු තක්සේරු වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසන් දිනට ගෙවිය යුතු හිඟ බදු මුදල් හා දඩ පොලී වටිනාකම රු.10,571,760 කි.	2024 මාර්තු 22 දිනට රු.10,571,760 ක මුදලක් ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බවත් මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු කරන බවත් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙන් වාචිකව දැන්වූ බව. .	ගෙවිය යුතු හිඟ බදු මුදල් හා දඩ පොලී සම්බන්යෙන් අදාළ පාර්ශවයන් සමඟ විධිමත් හා කාර්යක්ෂම ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමුකළ යුතුය.
(ඇ) මූල්‍ය ප්‍රකාශන සටහන් අංක 32 හි නඩු අංක 51824/ MR සඳහා වූ තීන්දු ප්‍රකාශය ප්‍රකාරව රුපියල් මිලියන පනහක (රු.50,000,000) මුදලක් සාමූහිකව සහ/හෝ වෙන් වෙන්ව පැමිණිලිකරුට අයකරවාදෙමින් ලබාදී තිබූ තීන්දුව ඉවත් කර ගැනීමට සිවිල් නඩු විධාන සංග්‍රහයේ 86(2) වගන්තිය ප්‍රකාරව ඉල්ලීමක් කර තිබුණද මේ සඳහා ගිණුම් තුල රු.2,000,000 ප්‍රතිපාදනයක් පමණක් සිදු කර තිබුණි	වර්ෂ 2023.03.21 වන දින කඩුවෙල දිසා විනිසුරු විසින් විත්තිකරුවන්ට එරෙහිව ඒකපාර්ශවිකව පැමිණිල්ලේ වාසියට තීන්දුවක් ප්‍රකාශ කර ඇත. ඒ අනුව සිවිල් නඩු විධාන සංග්‍රහයේ 86(2) වගන්තිය ප්‍රකාරව විත්තිකරු විසින් මෝසමක් මගින් පෙත්සමක් සහ දිවුරුම් පෙත්සමක් ගොනු කර කරුණු තහවුරු කිරීම සඳහා 2024.02.09 වන දින නඩුව කැඳවන මෙන් ඉල්ලීමක් සිදු කර ඇති බව.	ආයතනික කටයුතු වලදී සැලකිලිමත්ව කටයුතු කළයුතු අතරම නඩු කටයුතු වලදී අධිකරණ කැඳවීම් හා නියෝගයන්ට අදාළව කටයුතු කළ යුතුය.
(ඈ)2015 වර්ෂයේ සමාගමෙහි ස්කන්ධ ප්‍රාග්ධනය රු. 3,198,499,721 ක් වූ අතර 2023 වර්ෂයේදී රු.489,921,592 ක් දක්වා අඛණ්ඩව අඩු වී සමාලෝචිත වර්ෂයේ දී රජයේ මුදල් ප්‍රතිපාදන හේතුවෙන් රු.586,757,702 ක් දක්වා එය වැඩි වී තිබුණි. සමාගම 2016 වර්ෂයේ සිට 2023	ආයතනයේ පෙර වර්ෂ හා සැසඳීමේදී 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රගතියක් ලබා ඇති බවත් ඒ අනුව 2023 වර්ෂය සමඟ සැසඳීමේදී 2024 වර්ෂයේ ආදායම සියයට 20 කින් පමණ	තවදුරටත් ස්කන්ධ ප්‍රාග්ධනය වැඩි කර ගැනීමට හා පවත්වාගෙන යාමට කටයුතු

වර්ෂය දක්වා අඛණ්ඩව අලාභ ලබා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ අලාභය රු.13,114,063කි. සමාගම යටතේ පවතින අයිටීඑන්,ලක්හඬ හා වසන්තම් එෆ්එම් හි අලාභයන් පිළිවෙලින් රු.1,930,887 ක්, රු.22,626,550 ක් සහ රු.1,858,792 ක් වී තිබුණි.	වර්ධනය වී ඇති බවත් අලාභ තත්වයද 2023 වර්ෂයේ රු.මිලියන 164 ක් වූ අතර, 2024 වර්ෂයේදී රු.මිලියන 49 ක ලාභදායී තත්වයක් පෙන්නුම් කරන බව.	කළ යුතුය.
(ඉ) සමාලෝචිත වර්ෂය තුල දී සමාගම විසින් සුභ සාධන සංගමය වෙනුවෙන් රැස් කරන ලද රු. 1,276,123ක මුදලින් ඉකුත් වර්ෂයේ දී සංගමයට ලබාදුන් රු.1,000,000 ක ණය මුදල අඩු කර ඉතිරිය සංගමයට ආපසු ලබා දී තිබුණි.නමුත් මෙහිදී,සංගමය රැස්කරන ලද අනුග්‍රාහක දැන්වීම් විකාශනය සඳහා සමාගම දරන ලද ගුවන් කාල පිරිවැය සලකා බැලීමකින් තොරව රැස් කල සම්පූර්ණ මුදලම සංගමයට ලබාදී තිබුණි.	රු.1,276,123 ට අදාල ගනුදෙනුව සමාගම විසින් කරන ලද ගනුදෙනුවක් බැවින් එය ආදායමට ඇතුලත් කළ යුතු බවත් එය පෙර වර්ෂ වල සිදු කරන ලද පරිදි ආදායමට ඇතුලත් කර නියමිත බදු මුදල් ද ගෙවා නිසි පරිදි ගිණුම් ගත කර ඇති බවත් පසුව අදාල අනුමැතීන් නිසි පරිදි ලබා ගැනීමෙන් පසු සුභසාධක සංගමයට ගෙවා ගිණුම් ගත කරන ලද බව	අනුග්‍රාහක දැන්වීම් විකාශනය සඳහා සමාගම දරන ලද ගුවන් කාල පිරිවැය සලකා බැලිය යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
සමාගම විසින් 2015 වර්ෂයේ මිලදීගත් රු.1,588,500 ක් වූ Hot Swappable Power Distribution Rack යන්ත්‍රයක් සහ 2010 වර්ෂයේ මිලදී ගන්නා ලද රු. 1,218,274 ක් වූ Aros Flexus FT- 30 ,30KVA UPS System යන්ත්‍රයක් වසර 04 ක පමණ කාලයක සිට භාවිතයකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.	පැවති ආර්ථික අර්බුදය හමුවේ දත්ත ගබඩා ස්ථානයට අදාල උපකරණ මිලදී ගැනීම කල් තැබූ බවත්, මේ වන විටත් එය මුදල් ප්‍රතිපාදන නොමැති හේතුවෙන් යෝජිත තත්වයක පවතින බවත් මෙම උපකරණය මේ වන විටත් භාවිතයට යොදා ගත හැකි පරිදි සුරක්ෂිතව තබා ඇති බවත් දක්වා ඇත. 2010 වර්ෂයේ මිලදී ගත් රු. 1,218,274 ක් වූ 30KVA Aros Flexus FT – 30 UPS උපකරණය පිළිස්සීමකට භාජනය වී, අදාල රක්ෂණ වන්දි ලබා ගෙන තිබුණු බවත් එම උපකරණය අලුත්වැඩියා කිරීමට විගණිත දින දක්වා කටයුතු කර නොතිබුණු බවත් ඉහත සඳහන් UPS යන්ත්‍රය ගිනි ගෙන පිලිස්සී අලුත්වැඩියා කිරීමට නොහැකි තත්වයේ පැවති බැවින්, එය අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් පාඩුවක් බැවින්, අලුත්වැඩියා නොකරන ලද බව.	වත්කම් නිසි අන්දමින් උපයෝජනය කිරිම සඳහා කටයුතු කළ යුතු ය.